# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1831/9 - 2013 ඔක්තෝබර් මස 08 වැනි අඟහරුවාදා - 2013.10.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ශ්‍රී ලංකා මහ බැංකුවේ නිවේදන

**2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත**

2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතේ 12 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් දෙන ලද විධානය.

නිවාඩ් අජිත් ලෙස්ලි කබ්රාල්,
මුදල් මණ්ඩලයේ සභාපති සහ
ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති.

වර්ෂ 2013 ක් වූ ජූලි මස 26 වැනි දින,
කොළඹ දී ය.

2013 අංක 4 දරන මුදල් සමාගම් (ද්‍රවශීල වත්කම්) විධානය

1. මෙම විධානය 2013 අංක 4 දරන මුදල් සමාගම් (ද්‍රවශීල වත්කම්) විධානය යනුවෙන් හඳුන්වනු ලබන අතර, එය 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත යටතේ බලපත්‍රලාභී සෑම මුදල් සමාගමකටම, මෙම විධානයෙහි දිනයේ සිට ක්‍රියාත්මක වන පරිදි අදාළ විය යුතු ය. *හැඳින්වීම*

2. සෑම මුදල් සමාගමක්ම, 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතේ 74 වන වගන්තියෙහි අර්ථකථනය කර ඇති පරිදි අවම ද්‍රවශීල වත්කම් ප්‍රමාණයක් පවත්වාගෙන යා යුතු අතර, එම ප්‍රමාණය ඕනෑම දිනයක ව්‍යාපාර කටයුතු අවසන් කරන අවස්ථාවේදී ; *කාලීන තැන්පතු, ඉතුරුම් තැන්පතු හා පැවරිය නොහැකි තැන්පතු සහතික සඳහා වන ද්‍රවශීල වත්කම් අවශ්‍යතාවය*

(i) (අ) මුදල් සමාගමක් විසින් එකී දිනය අවසානය වන විට භාරගෙන ඇති කාලීන තැන්පතුවල ගෙවිය යුතුව පවතින වටිනාකම හා ගෙවිය යුතු පොළියෙන් ; සහ

(ආ) එම මුදල් සමාගම විසින් එකී දිනය අවසානය වන විට නිකුත් කර ඇති පැවරිය නොහැකි තැන්පතු සහතිකවල මුහුණත වටිනාකම හා ගෙවිය යුතු පොළියෙන් සියයට දහයක (10%) ; සහ

(ii) එකී දිනය අවසානය වන විට එම මුදල් සමාගම විසින් භාරගෙන ඇති ඉතිරි කිරීමේ තැන්පතුවලින් ආපසු නොගෙවා ඇති ශේෂයෙන් හා ගෙවිය යුතු පොළියෙන් සියයට පහළොවක (15%) ;

එකතුවට නොඅඩු විය යුතු ය.

1A - G 018363 — 170 (2013/10)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ණය ගැනීම් සඳහා වන ද්‍රවශීලී වත්කම් අවශ්‍යතාවය

3. 2 වගන්තියේ අවශ්‍යතාවයට අමතරව සෑම මුදල් සමාගමක්ම 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතේ 74 වගන්තියෙහි අර්ථ දක්වා ඇති පරිදි අවම ද්‍රවශීල වත්කම් ප්‍රමාණයක් පවත්වා ගත යුතු අතර, එකී ප්‍රමාණය 2014.01.01 දින සිට බලපවත්වන පරිදි ඕනෑම දිනක ව්‍යාපාර කටයුතු නිම කරන අවස්ථාවේදී ප්‍රාග්ධන අරමුදලේ ඇතුළත් ණය සහ වත්කමෙහි වෙළඳපොල වටිනාකම ඉක්මවා නොයාමට යටත්ව සමාගමෙහි වත්කම් උකසක් මත ලබාගත් ණයද හැර, මුළු පිටහිටි ණය ගැනීම් සහ අධ්‍යක්ෂ විසින් තීරණය කරන වෙනත් ඕනෑම ගෙවිය යුතු වටිනාකම්වලින් සියයට 5 කට නොඅඩු විය යුතු ය. එම ප්‍රමාණය 2014.07.01 දින සිට බලපවත්වන පරිදි සියයට 10 ට නොඅඩු විය යුතු ය.

ශ්‍රී ලංකා රජයේ භාණ්ඩාගාර බිල්පත්, ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් හා ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත් අවශ්‍යතාව

4. 4.1 සෑම මුදල් සමාගමක්ම සැමවිටම, පෙර මුදල් වර්ෂයේ මාස දොළහේ එක් එක් මාසය අවසානයට පැවැති තැන්පතු වගකීම්වල සහ ණය ගැනීම්වල එකතුවේ සාමාන්‍යයෙන් සියයට හත හමාරකට (7.5) සමාන වත්කම්, ශ්‍රී ලංකා රජයේ භාණ්ඩාගාර බිල්පත්, ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් හා ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත් වශයෙන් පවත්වා ගත යුතු ය. මෙම ගණනය කිරීම සඳහා ආයෝජන අරමුදල් ගිණුම භාවිතයෙන් පවත්වා ගන්නා ශ්‍රී ලංකා රජයේ භාණ්ඩාගාර බිල්පත්, ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් හා ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත් සළකා නොබැලිය යුතු ය.

4.2 ඉහත 2 සහ 3 වන වගන්තියේ සඳහන් ශ්‍රී ලංකා රජයේ භාණ්ඩාගාර බිල්පත්, ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් හා ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත් ඉහත 4.1 වගන්තියේ සඳහන් ද්‍රවශීල වත්කම්වල කොටසක් වේ.

4.3 මුදල් සමාගමක් විසින් ඉහත 4.1 වන වගන්තියට අනුකූල වෙමින් පවත්වා ගනු ලබන ශ්‍රී ලංකා රජයේ භාණ්ඩාගාර බිල්පත්, ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් හා ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත් බලපත්‍රලාභී වාණිජ බැංකු එකක් හෝ ඊට වැඩි ගණනක හෝ ප්‍රාථමික අලෙවිකාර සමාගම් එකක් හෝ ඊට වැඩි ගණනක හෝ භාරයේ තැබිය යුතු ය.

වාර්තා කිරීම

5. සෑම මුදල් සමාගමක් විසින්ම තම ද්‍රවශීල වත්කම් පසුව එළඹෙන මාසයේ හත්වන (7) දින හෝ ඊට පෙර ජාලගත වාර්තාකරන පද්ධතිය හරහා අධ්‍යක්ෂ වෙත වාර්තා කළ යුතු ය.

අර්ථ දැක්වීම

6. මෙම විධානයෙහි,

(i) "කාලීන තැන්පතු " යන්නෙන් මුදල් සමාගම් (තැන්පතු) විධානයෙහි සඳහන් අර්ථයම අදහස් විය යුතු ය.

(ii) "මුළු තැන්පතු වගකීම" සමන්විත වනුයේ පිටහිටි කාලීන තැන්පතු වටිනාකම, පිටහිටි පැවරිය නොහැකි තැන්පතු සහතිකවල මුහුණත් වටිනාකම සහ පිටහිටි ඉතුරුම් තැන්පතු වටිනාකම් යන ඒවායෙනි.

(iii) "අධ්‍යක්ෂ" යන්නෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ, බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා අදහස් වේ.

(iv) "ණය ගැනීම්" යන්නෙන් ණය/බැංකු අයිරා මගින් ලබාගත් අරමුදල්, සම්බන්ධිත පාර්ශවවලට ගෙවිය යුතු ප්‍රමාණයන් හෝ සමුච්චිත හා නිදහස් කළ හැකි වරණීය කොටස්, සුරැකුම්කරණයන්, බැඳුම්කර, ණයකර, පොරොන්දු නෝට්ටු, වාණිජ පත්‍රිකා නිකුතු, වෙනත් ඕනෑම කළ යුතු ගෙවීමක් සහ අධ්‍යක්ෂ විසින් තීරණය කරනු ලබන වෙනත් ඕනෑම ණය ගැනීමක් අදහස් විය යුතු ය.

(v) "බලපත්‍රලාභී වාණිජ බැංකු " යන්නෙන් 1988 අංක 30 දරන බැංකු පනතේ සඳහන් නිර්වචනයට සමාන අර්ථය දිය යුතු ය.

(vi) "ප්‍රාථමික අලෙවිකාර සමාගම" යන්නට 1995 අංක 31 දරන පනතින් සංශෝධිත (420 වන අධිකාරිය වූ) දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනතේ 16 වැනි වගන්තිය යටතේ පනවන ලද 2002 අංක 1 දරන දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනත (ප්‍රාථමික අලෙවිකරුවන්) නියෝගයන්හි සහ 1995 අංක 32 දරන පනතින් සංශෝධිත (420 වන අධිකාරිය වූ) ලියාපදිංචි ස්කන්ධ සහ සුරැකුම්පත් ආඥාපනතේ 55 වැනි වගන්තිය යටතේ නිකුත් කළ 2002 අංක 1 දරන ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් ආඥාපනත (ප්‍රාථමික අලෙවිකරුවන්) නියෝගයන්හි සඳහන් නිර්වචනයට සමාන අර්ථ දිය යුතු ය.

අහෝසි කිරීම

7. 2009 අංක 1 දරන මුදල් සමාගම් (ද්‍රවශීල වත්කම්) විධානය මෙයින් අහෝසි කරනු ලැබේ.

10-675

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.